# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1807/11 - 2013 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා - 2013.04.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

**76(2) වගන්තිය යටතේ නියෝගය**

බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 76(2) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල්, ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලි බල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, එම ප්‍රඥප්තියේ 39(4) උප වගන්තිය ප්‍රකාරව, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේදී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට හෝ ලියා අත්සන් කරනු ලබන යම් නිශ්චල දේපළ පැවරීමකට අදාළ යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් කිසිම මුද්දර ගාස්තුවක් අය නොකරන බවට සැහීමකට පත්වී ඇති බැවින්, යථෝක්ත වගන්තියේ ප්‍රකාර මෙම නියෝගය ගැසට් පත්‍රයක් මඟින් ප්‍රකාශයට පත්වුදා සිට යථෝක්ත ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යය විසින් හෝ ඒ වෙනුවෙන් හෝ එහි නමට හෝ ලියා අත්සන් කරනු ලබන කොළඹ 03, ගාලු පාර, නො. 148 දරන ස්ථානයේ පිහිටි ඉඩම සහ ගොඩනැගිලි මිළදී ගැනීම සඳහා මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම ක්‍රියාත්මක විය යුතු බැව් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය
සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්.
අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලි බල
හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන සහ වෙළඳ අමාත්‍ය.

2013 අප්‍රේල් මස 23 වැනි දින,
ශ්‍රාවස්ති මන්දිරය,
කොළඹ 07,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

05 - 198

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - PG 001612— 435 (2013/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.